එකතුව		**13,836,502**	**15,703,554**		**15,601,394**	**16,897,976**

සටහන 39

ජංගම ගිණුම					2019	2018
	සටහන			**සටහන**		
අර්ධ කාලීන					99,245,458	85,109,425
ලංජකාඅඳා					(99,245,458)	(85,109,425)
එකතුව		-	-		-	-

සටහන 40

ලැබිය යුතු/ ගෙවිය යුතු					2019	2018
	සටහන			**සටහන**		
ලැබිය යුතු MTTC දීමනා						72,058
ගෙවිය යුතු MTTC දීමනා						(72,058)
ලැබිය යුතු විදුලි වියදම්					595,043	264,256
ගෙවිය යුතු විදුලි වියදම්					(595,043)	(264,256)
එකතුව		-	-		-	-

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
ආධුනික පුද්ගල අනතුරු හා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

වත්කම්	2019	2018
ස්ථාවර වත්කම්		
ස්ථාවර තැන්පතු	8,604,785	8,039,075
ජංගම වත්කම්		
බැංකු ශේෂය	3,325,664	2,706,671
ලැබිය යුතු වාරික ආදායම	160,325	98,975
ලැබිය යුතු පොලී	314,250	279,299
මුළු වත්කම්	**12,405,024**	**11,124,020**
වගකීම්		
රක්ෂණ ගෙවීම්		1,085
	12,405,024	11,122,935
වගකීම්		
සමුච්චිත අරමුදල	11,122,934	9,982,792
එකතුකලා- අතිරික්තය	1,282,090	1,140,142
මුළු වගකීම්	**12,405,024**	**11,122,934**

අධ්‍යක්ෂ/විදුහල්පති
ලංජකාඅආ

ගණකාධිකාරී
ලංජකාඅආ

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
ආධුනික පුද්ගල අනතුරු හා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

	2019	2018
ආදායම		
වාරික ආදායම	447,375	326,025
පොලී ආදායම	834,715	788,713
එකතුව	1,282,090	1,114,738
වියදම		
අනෙකුත් වියදම්		1,208
රක්ෂණ ගෙවීම්		1,085
බැංකු ගාස්තු		1,400
එකතුව		**3,693**
අතිරික්තය	**1,282,090**	**1,111,045**
පෙර වර්ෂයේ ගැලපුම්		29,097
අතිරික්තය	**1,282,090**	**1,140,142**

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
ආධුනික පුද්ගල අනතුරු හා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

විස්තරය	සටහන	2018	2017
මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහය			
මෙහෙයුම් කටයුතුවලින් අතිරික්තය/ඌණතාවය		1,282,090	1,140,142
ඉකුත් වර්ෂ ගැලපීම්			
		1,282,090	1,140,142
උපචිත වියදම් වැඩිවීම/අඩුවීම			
සමුච්චිත වියදම් වැඩිවීම/අඩුවීම			
ජංගම වගකීම් වැඩිවීම/අඩුවීම		(1,085)	1,085
ජංගම වත්කම් වැඩිවීම/අඩුවීම		(96,302)	(122,699)
තොාග වැඩිවීම/අඩුවීම			
මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		1,184,703	1,018,528
මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහය			
ආයෝජන වැඩිවීම/අඩුවීම		(565,710)	(549,148)
		618,993	469,380
කාලපරිච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		2,706,671	2,237,291
කාලපරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ		**3,325,664**	**2,706,671**

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
ආධුනික පුද්ගල අනතුරු හා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය

	සමුච්චිත අරමුදල	**මුළු වටිනාකම**
ආරම්භක ශේෂය 01.01.2019	11,122,934	11,122,934
පෙර වර්ෂ ගැලපුම්		
කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය	1,282,090	1,282,090
	12,405,024	**12,405,024**
2019.12.31 දිනට ශේෂය	**12,405,024**	**12,405,024**

1. පොදු තොරතුරු

1.1 ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය 2017 අංක 15 දරන පනතින් පිහිටුවන ලද කාර්මික පුහුණු ආයතනයකි.

1.2 ගිණුම් කාල සීමාව

2019 ජනවාරි 01 දින සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා වන මාස 12 ක කාල පරිච්ඡේදයකි.

2. ගිණුම් පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් ඉදිරිපත් කර ඇති රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත වලට අනුකූල ලෙස ආයතනයේ ගිණුම් ප්‍රකාශන පිළියෙල කරන ලදි.

ගිණුම් ප්‍රකාශණ වල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය,අරමුදල් හා සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් ඇතුලත්ය.

2.2 අඛණ්ඩ පැවැත්ම

ආයතනයට අඛණ්ඩ පැවැත්මක් ඇති බව සලකා ගිණුම් ප්‍රකාශන පිළියෙල කර ඇත.

2.3 මිණුම් කිරීමේ පදනම

අදාල සටහන් වලින් විශේෂයෙන් හෙලිදරව් කර නොමැති අවස්ථා වලදී මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම හා ඓතිහාසික පිරිවැය පදනම් කර පිළියෙල කර ඇත.

ඉඩම් හා ගොඩනැගිලි 2013 වසරේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රත්‍යාගණනය කර ඇත. එලෙසම වාහන 2014 වසරේදී ප්‍රත්‍යාගණනය කරන ලදි. 2014 වසරේදී රු.1,899,262.00 ක වටිනාකමට පුස්තකාල පොත් තක්සේරු කර ගිණුම්වලට ගැනීමට කටයුතු කරන ලදි.

2.4 ක්ෂය කිරීම

මිලදීගත් මස සිට ස්ථාවර වත්කම් ක්ෂය කරනු ලැබේ. ආයතනයේ වාර්ෂික ක්ෂය කිරීමේ අනුපාතයන් පහතින් සඳහන් කර ඇත.

	වාර්ෂික අනුපාතය
ගොඩනැගිලි	10%
මෝටර් රථ වාහන	25%
යන්ත්‍ර හා පුහුණු උපකරණ	12.5%
ලීබඩු උපකරණ	10%
කාර්යාල උපකරණ	25%
අනෙකුත් උපකරණ	25%
පුස්තකාල පොත්	25%

ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් හෝ ඊට අඩු කාලයක් පවතින වත්කම් ජංගම වත්කම් ලෙස වර්ග කර ඇත. තොගය පෙර ලැබීම් පෙර නිකුතු ක්‍රමයට අගය කර ඇත.

2.5 විදේශ මුදල් ගණුදෙනු

විදේශ මුදලින් සිදු කරන ගණුදෙනු වලදී ගණුදෙනු සිදුවූ දිනට පැවති විනිමය අනුපාතය අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කර ගිණුම් ප්‍රකාශවල පෙන්වනු ඇත.

2.6 ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන ගණුදෙනු

ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන සියලු ප්‍රමාණාත්මක ගණුදෙනු ගිණුම් ප්‍රකාශන සඳහා අදාල කරගනු ලැබේ.

3. වගකීම් හා වෙන්කිරීම්

3.1 ගිණුම් ප්‍රකාශන පිළියෙල කිරීමේදී හඳුනාගත් සියලු වගකීම් ගිණුම්ගත කර ඇත. එලෙසම විය හැකි වගකීම් සඳහා ප්‍රමාණාත්මක වෙන් කිරීමක් සිදු කර ඇත.

3.2 විශ්‍රාම පාරිතෝෂික

ගිණුම් ප්‍රකාශන පිළියෙල කිරීමේදී 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත අනුව, විශ්‍රාම පාරිතෝෂික වෙන් කිරීම සිදු කරනු ලැබේ. එලෙසම ශ්‍රීලංගම ජනතාකරණය කරන අවස්ථාවේදී සේවයේ යෙදී සිටි (1990/12/28) සේවකයින් සඳහා 1994 අංක 21 දරණ ශ්‍රී ලංගම පාලක මණ්ඩල පත්‍රිකා අංක 21 අනුව සේවය කල වසරකට අමතර සති 02 ක පාරිතෝෂික වෙන් කරනු ලැබේ.

3.3 විලම්භීත ආදායම්

භාණ්ඩාගාර ලැබෙන ප්‍රාග්ධන ප්‍රතිපාදන විලම්භීත ආදායම ලෙස ගිණුම්ගත කර ඇත. මෙම වටිනාකම වාර්ෂික ක්ෂය ප්‍රමාණය මත කපා හරිනු ලැබේ.

3.4 සේවක අර්ථ සාධක අයකිරීම්

සේවක අර්ථ සාධක අරමුදල සඳහා ආයතනයෙන් දායකත්වය 12% කි. සේවක දායක මුදල 08% කි. එලෙසම ශ්‍රී ලංගම පත්වීම්ලාභී සේවක දායක මුදල 10% කි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } වීවීවයි/ඒ/සිජීවීවීඅයි/1/19/05

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date } 2020 ජූලි 21 දින

අභ්‍යන්තර විගණන අංශය

31 JUL. 2020

ළං.ජ.කා. අභ්‍යාස ආයතනය
මොරටුව.

සභාපති
ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාවනය

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 වන ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු එකතු පිරිවැය රු. 328,475,190 ක් වූ ස්ථාවර වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

අනුව, ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද මෙම වත්කම් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 9 හි 15 ඡේදයට අනුව තොග අගය කළ යුත්තේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු අගයට වුවද ආයතනය විසින් අමතර කොටස් තොගය අගය කිරීමේදී ශුද්ධ උපලබ්ධි අගයට ගණනය කිරීමකින් තොරව රු. 7,183,211 ක්වූ පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ පරිත්‍යාග ලෙස ලැබී තිබූ එකතුව රු. 500,000 ක් වූ වාහනය හා පුහුණු උපකරණවල වටිනාකම වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම් ලෙස හා ප්‍රාග්ධන සම්පාදන සංචිත යටතේ අනුචිත ලෙස දක්වා තිබුණි.

(ඈ) 2019 ඔක්තෝබර් 27 දින පුද්ගලික ආයතනයක් විසින් වැල්ඩින් පුහුණු වැඩසටහන් සඳහා පරිත්‍යාග ලෙස ලබා දී තිබූ යන්ත්‍රයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) 2019 වර්ෂයට අදාල එකතුව රු. 566,302 ක් වූ උපචිත වියදම් අයිතම 19 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) ආංශික නිපුණතා සංවර්ධන අරමුදල මගින් 2015 වර්ෂයේ දී ඉදිකරන ලද රු. 129,578,570 ක් වටිනාකමැති ගොඩනැගිල්ල ගිණුම් වලින් අත්හැරී තිබුණි.

(උ) වටිනාකම රු. 478,528,464 ක් වූ විධිමත් අනුමැතිය සහිත ජර්නල් වවුචර් 223 ක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එසේම එකතුව රු. 14,999,141 ක් වූ ණයගැනි හා ණයහිමි ශේෂ සනාථ කිරීම් විගණනය වෙත ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා නිවැරදිව සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ඌ) 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන් අමතර කොටස් තොගය භෞතික තොග සත්‍යාපන වාර්තා සමඟ සැසඳීමේ දී රු. 200,866 ක වෙනසක් විය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර

(104)

කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙලිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වීකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා හට ලබා ගැනීමට නොහැකි වූ අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් ඇති බව නිශ්චය කිරීමට මා හට නොහැකි විය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මතය සඳහා පදනම යටතේ ඇතුලත් (අ), (ආ) සහ (උ) ඡේද හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති/ විධානයට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 756	සෑම වර්ෂයකම දෙසැම්බර් 15 දින හෝ ඊට ආසන්න දිනයක භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත් කර දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණයක් සිදුකල යුතු වුව ද, ආයතනය විසින් විගණිත දිනය වූ 2020 ජූනි 03 දින තෙක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර 2018 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩලය මගින් සිදුකරන ලද යෝජනා ක්‍රියාත්මක කර නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 1646	වාර්තාව ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊළඟ මාසයේ 15 වන දිනට පෙර ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ආරම්භයේ සිටම ආයතනය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ)	2000 ජුනි 27 දිනැති අංක පීඑෆ්/පීඊ/9 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	රාජ්‍ය ආයතන සතු අතිරික්ත මුදල් භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව ස්ථාවර තැන්පතු , කාලීන තැන්පතු හෝ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය නොකළ යුතු වුවත් ,එසේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ආයතනය විසින් ස්ථාවර තැන්පතු ලෙස රු. 27,385,483 ක් ද ,භාණ්ඩාගාර බිල්පත් ලෙස රු. 11,803,478 ක් ද ආයෝජනය කර තිබුණි.
(ඇ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින්ම පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යම් කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත්, ආයතනය සතු වාහන 25 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාල නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනයකර භාවිතා කර නොමැති බව.

තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව පුද්ගලික ආයතනයක් මගින් පුහුණු උපකරණ පහක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේ දී බදු සහිත වටිනාකම රු. 1,342,950 ක් බව සඳහන්ව තිබියදී ඒ සඳහා මුදල් ගෙවීමේදී නැවත බදු එකතු කර ගෙවීම් කර තිබීම හේතුවෙන් රු. 191,371 ක් වැඩිපුර ගෙවා තිබුණි.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) ආයතනය විසින් ප්‍රායෝගික පුහුණුව ලබාදීමේදී අදාළ අභ්‍යාසලාභීන්ගේ ආරක්ෂාව උදෙසා ශිෂ්‍ය රක්ෂණ ප්‍රතිලාභ අරමුදල මගින් අවශ්‍ය ආරක්ෂිත උපකරණ කට්ටල ලබාදීමට කටයුතු කරන ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් උපදෙස් ලබාදී තිබුණද 2020 ජනවාරි 31 දිනවන විටත් එපරිදි කටයුතු කර නොතිබුණි. එසේම එම අභ්‍යාසලාභීන් පැළඳ සිටිය යුතු ආරක්ෂක පැලඳුම් කට්ටල මොනවාද යන්න හඳුනාගෙන නොතිබුණි.

(ආ) 2019 ජුනි 25 දින අමාත්‍යාංශයේ පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සිසුන් බඳවා ගැනීමේදී නිල ඇඳුම් ආයතනය විසින් සපයන බව ආයතනයේ අධ්‍යක්ෂ/ විදුහල්පතිවරයා විසින් දන්වා තිබුණද නිල ඇඳුම් සඳහා රෙදි, පොත් සහ බැගයක් නවක සිසුන්ට ලබාදීමේදී එක් ශිෂ්‍යයකුගෙන් රු. 3,800 ක් ආයතනයේ සුභ සාධක සංගමය විසින් අයකර තිබුණි.

(ඇ) 2019 වර්ෂයේ පුස්තකාල පොත් මිලදී ගැනීම සඳහා රු. 500,000 ක් වෙන්කර තිබුණද ඉන් රු. 117,223 ක් එනම් සියයට 23 ක් උපයෝජනය කරමින් පොත් 197 ක් පමණක් මිලදී ගෙන තිබුණි. එසේම 2019 ජනවාරි 28 වන දින බොරැල්ල ශාඛාවෙන් පුස්තකාලය වෙත ලබාදුන් පොත් 416 ක් පරිශීලනයකින් තොරව පුස්තකාල පරිශ්‍රය තුළ ගොඩගසා තිබුණි.

(ඈ) 2019 මැයි 23 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභා රැස්වීමේදී ගෙන තිබූ පහත සඳහන් තීරණයන් 2020 ජනවාරි 31 දින තෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(i) 2016 හා 2017 වර්ෂ වල වාර්තා මාසයක් ඇතුළත පාර්ලිමේන්තු සභා ගත කිරීම.

(ii) පුරප්පාඩු වී ඇති ප්‍රධාන තනතුරු පහට අදාළව අධ්‍යාපන සුදුසුකම් වලට සම වැටුප්තල සකස් කර ඒ පිළිබඳව භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර එම පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම.

(iii) ආයතනයේ සේවක තනතුරු ප්‍රති ව්‍යුහගත කිරීමේදී වැටුප් වර්ධක සම්බන්ධයෙන් ඇති වූ ගැටලු සහගත තත්ත්වයන් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර නිවැරදි කර ගැනීම.

(ඉ) එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් වසර 2030 වන විට සිය සංවිධානයට අයත් සියළුම රටවල ආර්ථික සංවර්ධනය සහ සමාජීය සංවර්ධනය හා පාරිසරික ආරක්ෂාව සැලසීම පදනම් කර ගනිමින් "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030" හඳුන්වා දී ඇති අතර, එය සියළු සාමාජික රටවල් විසින් ක්‍රියාත්මක කළ යුතු විශ්වීය ප්‍රකාශයක් වේ. ඒ අනුව, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය විසින් මෙම න්‍යාය පත්‍රයට අනුකූලව තම ආයතනයට ගැළපෙන අරමුණු 04 ක් හඳුනාගෙන තිබුණද එම අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ඉලක්ක එම

ඉලක්ක ළඟාකරගත යුතු ආකාරය, ඉලක්ක මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

(ඊ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2019 දෙසැම්බර් 31 දිනට රු. 657,330 ක වටිනාකම වූ අඩමාණ ණය වෙන් කිරීමෙන් පසු එකතුව රු. 3,849,591 ක් වූ ණයගැති ශේෂයක් වූ අතර ඒ තුළ වර්ෂ 10 ට වඩා පැරණි ණයගැති ශේෂය රු. 886,702 ක් සහ වර්ෂ 5 ත් 10 ත් අතර ණයගැති ශේෂය රු. 993,160 ක් වූ අතර එම ණය අයකර ගැනීම අවිනිශ්චිතව පැවතියදී ඒ සඳහා අඩමාණ ණය වෙන් කිරීම් සිදුකර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිළිතුරු වාර්තාව

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

1) මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාචනය
1.2 මතය ව්‍යාචනය සඳහා පදනම

අ) ආයතනය සතු වත්කම් ප්‍රත්‍යාගනය කිරීම සඳහා කමිටුවක් පත්කර තිබේ. 2020 සහ 2021 වසර වලදී රටතුල පැවති කොවිඩ් වසංගත තත්ත්වය නිසා සැලසුම් කල කාර්යයන් එම කාලසීමාවේ දී නිසි පරිදි සම්පූර්ණ කල නොහැකි විය. එලෙසම පුහුණු උපකරණ හා යන්ත්‍රෝපකරණ විශාල ප්‍රමාණයක් ආයතනය සතුව ඇති බැවින්, මෙම කාර්යය නිම කිරීම සඳහා වැඩි කාල සීමාවක් ගත වේ. ප්‍රත්‍යාගනය කාර්යය හැකි ඉක්මනින් සම්පූර්ණ කිරීමට අදාල නිලධාරින්ට උපදෙස් ලබා දී ඇති අතර, කාර්යය නිම කර වටිනාකම් ගිණුම්වල ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව සඳහන් කරමි.

ආ) අමතර කොටස් තොගය ශුද්ධ උපලබ්ධි අගයට ගණනය කර, එම වටිනාකම 2020 වසර වාර්ෂික ගිණුම් වලට ගෙන ඇත. ඒ අනුව පෙන්වා දී ඇති දෝෂය නිවැරදි කර ඇති බව සඳහන් කරමි.

ඇ) පරිත්‍යාග භාණ්ඩ ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම් ලෙස ඇතුලත් කර තිබූ දෝෂය 2020 වාර්ෂික ගිණුම් පිළියෙල කිරීමේ දී නිවැරදි කර තිබේ.

ඈ) පෙන්වා දී ඇති යන්ත්‍රයේ වටිනාකම ගණනය කර 2020 වාර්ෂික ගිණුම් පිළියෙල කිරීමේ දී ගිණුම්ගත කර ඇත.

ඉ) 2020 වාර්ෂික ගිණුම් පිළියෙල කිරීමේ දී පෙර වර්ෂ ගැළපුම් යටතේ නිවැරදි කර ඇත.

ඊ) 2020 වාර්ෂික ගිණුම් පිළියෙල කිරීමේ දී මෙම ගොඩනැගිල්ලේ වටිනාකම ගිණුම්ගත කර සඳහන් කර ඇති දෝෂය නිවැරදි කර තිබේ.

උ) ජර්නල් වවුචර ගණකාධිකාරී පරීක්ෂා කර ප්‍රධාන ගණකාධිකාරී විසින් අනුමතකර තිබේ. එසේ නමුත් ආයතන ප්‍රධානියා ජර්නල් වවුචර අනුමත කර තිබිය යුතු බව රජයේ විගණන නිලධාරින් විසින් පෙන්වා දී තිබේ. 2020 වසර සිට පිළියෙල කරන ලද ජර්නල් වවුචර සඳහා ආයතන ප්‍රධානියාගේ අනුමැතිය ලබාගෙන තිබේ. ඒ අනුව පෙන්වා තිබූ දෝෂය නිවැරදි කර ඇත. ණයගැතියන් හා ණයහිමියන් සඳහා ශේෂ සනාථ කිරීමට ලිපි යොමුකරන නමුත් ඒ සඳහා නිසි පිළිතුරු නොලැබේ. 2020 සහ 2021 වසර වලදී ශේෂ සනාථ කිරීම් ලබාගැනීම සඳහා ලිපි යොමුකර තිබේ.

ඌ) 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අමතර කොටස් තොගය රු.7,183,211.00 ක් ලෙසද ලිපිද්‍රව්‍ය හා පින්තාරු බඩු තොගය රු.200,867 ක් ලෙස ද, වෙන වෙනම සඳහන් කර තිබේ. භෞතික තොග සත්‍යාපන වාර්තාවේ මෙම අයිතම දෙකම එකතුවක් ලෙස සඳහන් කර තිබේ. ඒ අනුව ගිණුම්වල ඉදිරිපත් කිරීමේ වෙනසක් නොමැති බව පෙන්වා දෙමි.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.</u>

1.4 <u>මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම</u>

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

	නීතිරීති/ විධානයට යොමුව	**විස්තරය**	**පිළිතුර**
අ)	i. මුදල් රෙගුලාසි 756	2019 වසර භාණ්ඩ සමීක්ෂණය	2019 වසර භාණ්ඩ සමීක්ෂණය අවසන් කර 2020/09/30 දින සමීක්ෂණ වාර්තාව විගණනකාධිපති වෙත ඉදිරිපත්කර තිබේ.
	ii. මුදල් රෙගුලාසි 1646	දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	දැනට එක දිගට වසර ගණනක් භාවිත කල හැකි ලෙස සකස් කර ඇති පිටු 100කින් සමන්විත ධාවන සටහන් පොත (PV 11) පිටපත් ඉදිරිපත් කර ඇත
ආ)	2000 ජූනි 27 දිනැති අංක PF/PE/9 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය	ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබීම.	ආයතනය සතු ආයෝජන සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කල නමුත්, ඒ සඳහා පිළිතුරක් නොලැබුනි. මෙම ආයෝජන ආයතනයේ ඵලදායි කාර්යයන් සඳහා යොදවන ලෙසට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින්ද උපදෙස් දී ඇත. එලෙසම අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී ද මේ පිළිබඳ සාකච්ඡා කර තිබේ. ඒ අනුව 2020/06/08 දිනැති පාලක මණ්ඩල පත්‍රිකා අංක 2020/04/01 යටතේ සේවක ණය යෝජනා ක්‍රමය සඳහා රු.මිලියන 10 ක් යෙදවීමටත්, 2020/06/29 දිනැති පාලක මණ්ඩල පත්‍රිකා අංක 2020/05/01 යටතේ, බොරැල්ල ශාඛාව වැඩි දියුණු කිරීම, බොඩි පේන්ටින් හා පින්තාරු අංශ ගොඩනැගිල්ලෙහි අඩුපාඩු සම්පූර්ණ කිරීම, අධ්‍යක්ෂ-විදුහල්පති නිල නිවස ප්‍රතිසංස්කරණය කිරීම, පංති කාමර වැඩි දියුණු කිරීම වැනි කාර්යයන් සඳහා අනුමැතිය ලබා ගෙන තිබේ. සැලසුම් කල කාර්යයන් වැඩි ප්‍රමාණයක් මේ වන විට සම්පූර්ණ කර තිබේ. මෙම කාර්යයන් සඳහා ගෙවීම් කිරීමට ස්ථාවර තැන්පතු අවලංගුකර අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගෙන තිබේ. ඒ අනුව මෙම කාර්යයන් සඳහා රු.මිලියන 18.69 ක ස්ථාවර තැන්පතු භාවිතා කර තිබේ. ඉතිරි ආයෝජනයන්ද සුදුසු පරිදි මෙම කාර්යයන් සඳහා භාවිතා කිරීමට පියවර ගනු ලැබේ.
(ඇ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය		ආයතනය ආරම්භයේ සිටම අද දක්වා ධාවන වාර්තාවේ (P 11) ඉන්ධන ලබා ගැනීම සටහන් කරන අතර, ඉන්ධන ලබා ගන්නා සෑම අවස්ථාවකම ඉන්ධන ටැංකිය මුළුමනින්ම පුරවනු ලබයි. සේවක බස් රථ කිහිපයක ඉන්ධන පරීක්ෂාව කරන ලද අතර, පවතින කොවිඩ් 19 හේතුවෙන් තාවකාලිකව එම පරීක්ෂා කිරීම නතර වූ අතර නැවත මෙම වසරේ සිට ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කරනු ලබයි.

2) 3. වෙනත් විගණන නිරීක්ෂණ

අ) බොඩි පේන්ටින් හා පින්තාරු අංශයේ ආධුනිකයින්ට අවශ්‍ය ආරක්ෂිත මුහුණු ආවරණ ලබාදීමට හා වෙල්ඩින් අංශයේ ආධුනිකයන්ට පුහුණුවෙන් පසු ඇස් සේදීම සඳහා අවශ්‍ය උපකරණයක් ලබාදීමට කටයුතු කරන ලදි. එසේම පසුගිය කාලසීමාවේ පැවති Covid – 19 වෛරසයෙන් ආරක්ෂාවීම සඳහා සියලු ආධුනික ආධුනිකාවන්ට අවශ්‍ය මුහුණු ආවරණ ශිෂ්‍ය රක්ෂණ ප්‍රතිලාභ අරමුදලේ මුදල් වලින් සපයාදීමට පියවර ගෙන තිබේ.

ආ) අදාල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාවේ **1.3 VI** ඡේදයේ ආයතනය විසින් ශිෂ්‍යයන්ට නිල ඇඳුම් සපයනු ලබන බව සඳහන් වුවද ආයතනයේ වියදමින් ශිෂ්‍යයන් වෙත නිල ඇඳුම් සැපයීමක් සිදු නොකරන බව දන්වමි.

ආයතනීය සුභසාධක සංගමය විසින් ආධුනිකයින්ට අවශ්‍ය පොත්, පොත් බෑගය සහ නිල ඇඳුම සහන මිලට ලබාගැනීමට අවස්ථාව සලසා දී ඇත.

(ඇ) 2019 වර්ෂයේ පුස්තකාල පොත් මිලදී ගැනීම සඳහා වෙන් කෙරුණු මුදලින් අවම ප්‍රමාණයක් උපයෝගි කර ගැනීමට සිදු වූයේ, පුස්තකාලය විසින් ප්‍රතිග්‍රහණය කිරීමට අපේක්ෂිත ග්‍රන්ථ (කාර්මික ක්ෂේත්‍රයට අදාල දේශීය ප්‍රකාශන) වෙළඳපල තුල නොතිබීමත්ය. 2019 ට පසු වර්ෂවල එනම් 2020 වර්ෂයේදී පුස්තකාලයට වෙන් කරන ලද සමස්ත මුදලින් ග්‍රන්ථ මිලදී ගැනීමේ කටයුතු බාධාවකින් තොරව සිදු කරන ලදි. මෙය අඛණ්ඩව ඉදිරියට සිදු කිරීමට අවශ්‍ය උපදෙස් ආයතන පරිපාලනය විසින් පුස්තකාලයට ලබා දෙන ලදි.

බොරැල්ල ශාඛාවෙන් 2019 වර්ෂයේදී පුස්තකාලයට පවරන ලද ග්‍රන්ථ 416ක ප්‍රමාණය පුස්තකාල තාක්ෂණික ක්‍රියාවලියට භාජනය නොකල තත්වයේ පැවති හෙයින් පරිශීලනයට අවස්ථා නොලැබුණද, එම වර්ෂය අවසාන වන විට පුස්තකාල එකතුවටත් පරිහරණයටත් එක් කරන ලදි.

වර්තමාන තත්වය අනුව පුස්තකාල සේවා ගුණාත්මක අයුරින් ලබා දීමට හැකියාව උදා වී ඇත.

(ඈ) (i) 2016 හා වාර්ෂික වාර්තා 2017 වාර්ෂික වාර්තා පිළියෙල කර, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත.

(ii) අධ්‍යක්ෂ - විදුහල්පති, නියෝජ්‍ය අධ්‍යක්ෂ - නියෝජ්‍ය විදුහල්පති, ප්‍රධාන ඉංජිනේරු - පුහුණු, ලේඛකාධිකාරී, ශාඛා විදුහල්පති (පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව - 05)
අධ්‍යක්ෂ - විදුහල්පති තනතුරට බඳවා ගැනීමට කිහිපවරක් අයදුම්පත් කැඳවුවද නියමිත සුදුසුකම් සහිත අයදුම්පත් ඉදිරිපත් නොවීම හේතුවෙන් එම බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි විය.
අධ්‍යක්ෂ - විදුහල්පති තනතුරට ස්ථීර පත්වීමක් සිදු කරන තෙක් එම ධූරයේ කාර්යයන් ඉටු කිරීම සඳහා පාලන මණ්ඩලය විසින්, මණ්ඩලයේ සාමාජිකයකු 2020.02.18 දින පත් කර ඇත.
නියෝජ්‍ය අධ්‍යක්ෂ - නියෝජ්‍ය විදුහල්පති තනතුරෙහි රාජකාරී ආවරණය සඳහා ප්‍රධාන ඉංජිනේරු - නිෂ්පාදන සේවා හා නඩත්තු තනතුර දරන නිලධාරි මහතා 2019.12.12 දින සිට පත් කර ඇත.

ලේඛකාධිකාරී තනතුරෙහි රාජකාරී ආවරණය සඳහා සහකාර ලේඛකාධිකාරී තනතුර දරන නිලධාරි මහතා 2013.05.17 දින සිට පත් කර ඇත.

ශාඛා විදුහල්පති අප ආයතනය යටතේ පැවති බොරැල්ල ශාඛාවේ එවකට පැවති පාඨමාලා මොරටුව මධ්‍යස්ථානය මඟින් පවත්වා ගෙන යනු ලබයි.

මෙම තනතුරු සඳහා බඳවා ගැනීමට පවතින ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) සමඟ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු නිලධාරීන් හමුවී සාකච්ඡා කල අතර, 2021 ජූලි මසදී අතිරේක ලේකම් (මානව සම්පත්) විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපියක් ද යොමු කර ඇත. (අදාල ලිපියේ පිටපතක් අමුණා ඇත)

(iii) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ට අනුව, ආයතනයේ කාර්ය මණ්ඩලය නව වැටුප් ක්‍රමයන්ට අන්තර්ග්‍රහණය කර ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේදී වසර ගණනාවක් පුරා දැඩි සේවක විරෝධතා පැවතුනි. සේවක ගැටළු නිරවුල් කර ගැනීම උදෙසා ආයතනයේ පැවැති උපදේශක මණ්ඩලය රේඛීය අමාත්‍යාංශ ලේකම් ඇතුලු නිලධාරීන්, ජාතික වැටුප් කොමිසම හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ අවස්ථා ගණනාවකදී සාකච්ඡා ගණනාවක් පවත්වමින් දැඩි ප්‍රයත්නයක් දරන ලදී. අන්තර්ග්‍රහණය ප්‍රමාද වීම තුලින් සේවක උසස්වීම් ලබා දිය නොහැකි වීම, වැඩි වන වැටුප් පරිවර්තන ලබා දිය නොහැකිවීම, කර්යක්ෂමතා විභාග පැවැත්විය නොහැකි වීම යනාදී ගැටළු නිර්මාණය වීමෙන් තවදුරටත් සේවක නොසන්සුන්තා වර්ධනය විය. අනතුරුව ආයතනයේ ක්‍රියාත්මක සියලු වෘත්තීය සමිති හා ඉහළ කළමනාකාරීත්ව නිලධාරින්ගෙන් සමන්විත කමිටුවක් මඟින් ජාතික වැටුප් කොමිසම හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පැවැති සාකච්ඡා වලදී ලද උපදෙස් හා දැනුවත් කිරීම් වලට අනුව සේවක ජ්‍යෙෂ්ඨත්වයට බලපෑම් නොවන පරිදි උපයා ගෙන ඇති වැටුප් වර්ධක අනුව අන්තර්ග්‍රහණය සිදු කරන ලදී. පසුව අභ්‍යන්තර විගණක විසින් එය නිවැරදි නොවන බව වාර්තා කල අතර ඒ අනුව, නැවත මුදල් අය කර ගැනීමට යාමේදී සේවක උද්ඝෝෂණ ඇති වීම දක්වා එම තත්වය වර්ධනය විය.

මෙම තත්වය රේඛීය අමාත්‍යාංශයට වාර්තා කිරීමෙන් අනතුරුව වැටුප් පරිවර්තන නැවත පරීක්ෂා කිරීමට ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) වෙත භාරදුන් අතර, එම වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමටද සේවක විරෝධතා හේතුවෙන් නොහැකි විය. ඒ අනුව නැවතත් රේඛීය අමාත්‍යාංශය වෙත කරුණු වාර්තා කිරීමෙන් අනතුරුව එවක නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම්වරියක මාර්ගයෙන් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ වාර්තාව නැවත සමාලෝචනය කිරීමට කටයුතු කරන ලදී.

වැටුප් නිවැරදි කිරීමට යාමේදී මතු වන සේවක උද්ඝෝෂණ හේතුවෙන් ආයතනයේ පරිපාලන හා පුහුණු කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාමට නොහැකි වන බැවින්, මෙම නිවැරදි කිරීම් සිදු කිරීමට දැනට දැඩි දුෂ්කරතාවයක් උද්ගතව ඇත.

මෙම ආයතනයේ කාර්ය මණ්ඩල සඳහා දේශීය මෙන්ම විදේශීය ශ්‍රම වෙළඳපොළ තුල පවතින ඉල්ලුම අනුව අඩු වැටුප් තලයන්වල ඔවුන් රඳවා ගැනීම දැඩි අභියෝගයක්ව පවතී. වැටුප් පරිවර්තන ක්‍රමවේදය සමාලෝචනයට ලක්කල අතිරේක ලේකම්තුමියද මේ සම්බන්ධව අවධාරණය කර ඇත. එසේම පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවද දැනුම් දී ඇත්තේ රේඛීය අමාත්‍යාංශය මැදිහත් වීමෙන් ජාතික වැටුප් කොමිසම හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර මෙම ආයතනයට ගැලපෙන විශේෂ වැටුප් ක්‍රමයක් අනුමත කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙසය. ඒ අනුව රේඛීය අමාත්‍යාංශය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් හා ජාතික වැටුප් කොමිසමෙන් ඒ සඳහා ඉල්ලීමක් කර ඇත. ඒ සඳහා මෙතෙක් ප්‍රතිචාරයක් ලැබී නොමැත.

(ඉ) අරමුණු 01 :- ගුණාත්මක අධ්‍යාපනය

අප ආයතනය මඟින් පූර්ණකාලීන පාඨමාලාවන් 11 ක් පවත්වනු ලබයි. ඒ සඳහා ආධුනිකයින් තෝරාගනු ලබන්නේ ඔවුන්ගේ රුචිකත්වය සහ පළමු වසර අවසානයේදී පවත්වනු ලබන විභාගයේදී ඔවුන් ලබාගන්නා ලකුණු පදනම් කරගෙනය. සතියේ දින 05න් දින 04ක් ප්‍රායෝගික අභ්‍යාසයන්හි යෙදෙන අතර, ඉතිරි දිනය සෛධාන්තික පංති සඳහා යොදවනු ලැබේ. එය අනුපාතයක් ලෙස ප්‍රායෝගික 80% ක් වන අතර, සෛධාන්තික 20% ලෙස දැක්විය හැකිය.

මෙම ප්‍රාථමික පුහුණු කාලයේදී ආධුනිකයින්හට සියලු වෘත්තීන් සඳහා අවශ්‍ය අධ්‍යාපනය කෙටිකාලීන අංශාන්තර පුහුණුව මඟින්ද කර්මාන්තශාලාවක ආරක්ෂිත උපකරණ සම්බන්ධයෙන්ද විධිමත් පුහුණුවක් ලබා දීමට කටයුතු කරනු ඇත.

ආධුනිකයින් කරන්නා වූ ප්‍රායෝගික අභ්‍යාස අලලා සතියකට වරක් එහි වාර්තාවක් (Weekly Report) ලිවිය යුතු අතර, ඇතැම් ප්‍රායෝගික කටයුතු සඳහා අදාල ව්‍යාපෘති වාර්තා (Project Report) පිළියෙල කිරීමද අනිවාර්යය වේ.

ආචාර්ය මණ්ඩලය 99% ක්ම පාහේ මෙම ආයතනයෙන්ම අධ්‍යාපනය ලැබූ අය වීමත් ඔවුන් සතු මනා ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම සිසුන්ගේ කුසලතා වර්ධනය සඳහා සෘජු දායකත්වයක් ලබා දේ. ආචාර්ය මණ්ඩලයේ තරුණ ගුරුවරුන් බොහෝ දෙනෙකු වැඩිදුර අධ්‍යාපනය සඳහා යොමු වී ඇති අතර, එය ආධුනිකයින්ගේ යහපතටද බෙහෙවින් ඉවහල් වේ. එයට ආචාර්ය මණ්ඩලයේ බොහෝ දෙනෙකු විදේශ ශිෂ්‍යත්ව, විදේශ රටවල රැකියාවල නිරත වීම සහ මෙරට ප්‍රමුඛපෙලේ ආයතන වල ප්‍රහුණුව ලැබීම ආදී වූ ක්‍රමයන්ගෙන් සිය දැනුම හා කුසලතා වර්ධනය කර ගත් පිරිසක් බැවින්, එහි ප්‍රතිලාභය ආධුනිකයින් වෙත ලැබෙන්නේ නිරායාසයෙනි. ආධුනිකයින්ගේ දැනුම උරගා බැලීම සඳහා වරින්වර විභාග පැවැත්වෙන අතර, එම කාලසීමාවන් අංශ මට්ටමින් තරමක් වෙනස් විය හැක. තවද කොවිඩ් වසංගතය හේතුවෙන් සිසුන් ආයතනයට කැඳවීමට නොහැකි වූ කාල වකවානු තුලදී මාර්ගගත ක්‍රමය ඔස්සේ සිසුන්ට දැනුම ලබා දෙමින් ඔවුන්ව ආයතනය සමඟ සම්බන්ධව තබා ගැනීමට කටයුතු කරන ලදි. නවීන තාක්ෂණය ඔස්සේ දරුවන්ට ඉගැන්වීමේ කටයුතු කරගෙන යනු ලබයි. තවද කාර්ය මණ්ඩලය හා පුහුණුව අවසන් ආධුනිකයින්හට NVQ 5 පාඨමාලාවද ඉන් ඉදිරියට ඩිප්ලෝමා, උපාධි හා පශ්චාත් උපාධිය දක්වා ද ඉගැනීමේ කටයුතු සඳහා අවශ්‍ය කාලය සහ දැනුම ලබා දීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මකව පවතී.

අරමුණ 02 - යහපත් ක්‍රියාකාරකම් සහ ආර්ථික වර්ධනය

අප ආයතනයේ පුහුණුව ලබන ආධුනික ආධුනිකාවන්ගේ දායකත්වය යටතේ සිදුකරනු ලබන සමාජ සුබසාධක වැඩකටයුතු රාශියකි. අප ආයතනයට ආසන්න මොරටුව සොයිසාරාමයේ සිදු කරනු ලබන පිංකම් ආදිය සඳහා අවශ්‍ය සහභාගිත්වය මෙන්ම විහාරස්ථානයේ සිදු කරන සුද්ද පවිත්‍ර කටයුතු සඳහා අවශ්‍ය ශ්‍රම දායකත්වය ලබා දීමද අප ආයතනය මඟින් සිදු කරනු ලබයි.

වසරකට වරක් හෝ දෙවරක් රජයේ පෙර රෝහලක (ලුනාව හෝ කලුබෝවිල) ඇදන්, රෝද පුටු ආදී උපකරණ ගෙන්වා අළුත්වැඩියා කර දීමද අප විසින් සිදුකරනු ලබන සමාජ සත්කාරයකි.

එසේම, ඕස්ට්‍රේලියානු ආදි ශිෂ්‍ය සංගමයේ දායකත්වය ඇතිව ඉතා අඩු පහසුකම් සහිත ගම්මාන වල ජීවත්වන පවුල් සඳහා නිවාස හා රෝහල් (කෑදෑව රෝහල) ආදියද තනා පරිත්‍යාග කොට ඇත. එවැනි කටයුතු වලදී ශ්‍රම දායකත්වය ලබා දීම අප ආධුනිකයින් විසින් ඉතා කැපවීමකින් යුතුව කරනු ලබන්නකි. සුනාමි උවදුර වූ අවස්ථාවේදී හානි වූ නිවාස පිළිසකර කිරීමේ කටයුතු වලදී නිවෙස් වල විදුලි කටයුතු සහ ජල නල කටයුතු සාදා උපකාර කරන ලදි. තවද වෙනත් රජයේ සහ පෞද්ගලික ආයතන වල වාහන අප ආයතනය තුලින් අළුත්වැඩියා කර ගත හැක. එමඟින් ආධුනිකයින්ගේ ප්‍රායෝගික දැනුම වර්ධනය වීම සිදුවන අතර, ආයතනයට ආදායමක්ද හිමි වේ.

අරමුණ 04 - අඩුකල අසමානතාවය

සෑම වසරකම ආයතනය මඟින් පවත්වනු ලබන ආගමික උත්සව කිහිපයකි. බෞද්ධ සැදැහැවතුන් වාර්ෂික පිරිත් පිංකමද ,හිංදු බැතිමතුන් විසින් සිදු කරන සරස්වති පූජා උත්සවයද ,ඉස්ලාම් බැතිමතුන් විසින් රාමසාන් උත්සවයද වර්ෂය අවසානයේ දී කතෝලික බැතිමතුන් විසින් නත්තල් උත්සවයද ,මේ සියළු ආගමික උත්සව සියළු ආගමික හෝ වාර්ගික භේදයකින් තොරව ආයතනයේ පොදු කටයුතු ලෙස සලකා සියළු දෙනා දායකත්වය සැපයීම සහභාගී වීමද විශේෂයෙන් සඳහන් කල යුතුය.

සිංහල හා හිංදු අලුත් අවුරුද්ද නිමිත්තකොට ගනිමින් අප්‍රේල් මස පවත්වනු ලබන අවුරුදු උත්සවයද සියලු දෙනා ඉතා සතුටින් සහභාගී වන සංස්කෘතික අංගයකි. සෑම වර්ෂයකම පළමු හෝ දෙවන අධ්‍යයන වාර ඇතුලත අංශාන්තර ක්‍රිකට්, පාපන්දු, වොලිබෝල් තරඟ මාලාවක් පැවැත්වීම ද ආධුනිකයින්ගේ ක්‍රීඩා කෞශල්‍යය, එකමුතුව සහ දරාගැනීමේ ශක්තිය වර්ධනය සඳහා බෙහෙවින් ඉවහල් වේ. ඊට අමතරව වසර දෙකකට පමණ වතාවක් නිවාසාන්තර ක්‍රීඩා උළෙලක් පැවැත්වීමද ආයතනයේ ආධුනික ආධුනිකාවන් වෙනුවෙන් සිදුකරනු ලබන මහඟු තටයුත්තකි.

එසේම සෑම අංශයක්ම නියෝජනය වන පරිදි සතියකට එක් දිනක් උදැසන 07.30 – 09.00 අතර කාලය තුල ක්‍රීඩා කිරීම සඳහා සෑම ආධුනිකයෙකුටම අවසර ලබා දී ඇත. මේ සඳහා මැනවින් නඩත්තු කරනු ලබන ක්‍රීඩා පිටියක් මෙන්ම කාය වර්ධන මධ්‍යස්ථානයක්ද අප සතුව පවතී.

ආයතනය සතුව තූර්ය වාදක කණ්ඩායමක් මෙන්ම බටහිර සංගීත තණ්ඩායමක්ද තිබෙන බව සඳහන් කල යුතුය. එසේම ආයතනයේ අවශ්‍යතාවය පරිදි විටින්විට පවත්වනු ලබන සංස්කෘතික සංදර්ශන සහ ප්‍රසංග සඳහා ඒ සඳහා දක්ෂකම් ඇති ආධුනික ආධුනිකාවන්ට ගායන, වාදන, රංගන, නිවේදන ආදී විවිධ ඉසව් ඔස්සේ සිය දක්ෂකම් පෙන්වීමට අවස්ථාව උදාවේ. මේ කටයුතු සඳහා බාහිර සංගීත උපදේශකවරයෙකුගේද සහය ලබාගන්නෙමු. මෙහිදී දරුවන්ගේ සමානතාවය සහ බැඳීම් වැඩිකෙරෙනු ඇත.

අරමුණු 05- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සහ සියළුම කාන්තාවන් හා ගැහැණු ළමයින් සවිබල ගැන්වීම.

සපුරාගැනීම සඳහා ඉලක්කයන් 5. a ජාතික නීති රීති වලට අනුකූලව කාන්තාවන්ට ආර්ථික සම්පත් සඳහා සමාන අවස්ථාව ලබා දීම.

ලං.ජ.කා.අ. ආයතනයේ පාඨමාලා සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයේම අධුනික ආධුනිකාවන් බඳවා ගැනීම සඳහා කටයුතු කලද, 2016 වසර වන විට කාන්තා ආධුනිකාවන් පාඨමාලා සඳහා යොමුවීම ඉතාම අවම මට්ටමක පැවතින. (වසරකට දෙදෙනෙක් හෝ තිදෙනෙක් පමණ) එබැවින් කාන්තා ආධුනිකාවන් සඳහාද පුහුණුවීම් කාර්යයන් සඳහා සමාන අවස්ථා ලබා දීම සඳහා කාන්තා ආධුනිකාවන් වැඩි ප්‍රමාණයක් (60) බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉලක්ක කරන ලදි.

- ප්‍රචාරණ කටයුතු වලදි කාන්තා ආධුනිකාවන් වැඩි කිරීම සම්බන්ධව ප්‍රමුඛතාවයක් ලබා දීම.
- ආයතනයට ආධුනිකයින් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ වලදි ආධුනිකාවන්ට විශේෂ අවස්ථාවක් ලබා දීම.
- කාන්තා ආධුනිකාවන් සඳහා නව පාඨමාලා ඇති කිරීම සඳහා සැලසුම් කිරීම.
- කාන්තා ආධුනිකාවන්ගේ පහසුකම් සඳහා රු මිලියන 13.00 ක පමණ වියදමින් ගොඩනැගිල්ලක් ප්‍රතිසංස්කරණය කිරීම.

ප්‍රගතිය

2020 වසර සඳහා ඇතුලත්කර ගන්නා ලද කාන්තා අධුනිකාවන් සංඛ්‍යාව 25 කි

(ඊ) පෙන්වා ඇති ණය ශේෂයේ වැඩි වටිනාකමක් ශ්‍රී ලංගම ආයතනයෙන් අයවීමට ඇති අගයන් වේ. මේ සම්බන්ධව ශ්‍රී ලංගම ආයතනය සමඟද අවස්ථා කීපයකදී සාකච්ඡා කර ඇත. අයකර ගැනීමට ඇති ණය ශේෂයන් පිළිබඳ ශ්‍රී ලංගම ඩිපෝවලද නිසි තොරතුරු නොමැති හෙයින් අයකර ගැනීමේ අපහසුතා පවතී. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලද මේ සම්බන්ධව සාකච්ඡා කර තිබේ. පාලක මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත්කර අයකරගත නොහැකි ණය ශේෂ කපාහැරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.



උපාලි රණසිංහ
අධ්‍යක්ෂ-විදුහල්පති
ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය